www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මැතිවරනයේ දී ආන්ඩුවට පවත්නා සහයෝගය වියැකී යයි

## Support for government fades in Sri Lankan election

**විජේ ඩයස් විසිනි**

**2009 ඔක්තෝබර් 12**

ඉසනසුරාදා පැවති දකුනු පලාත් සභා මැතිවරනයේ දී තමන් බලාපොරොත්තුව සිටි ආකාරයේ අතිමහත් ජයග්‍රහනයක් ලබා ගැනීමට පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) අසමත් විය. සියයට 85 සිට 90 දක්වා ඡන්ද ප්‍රමානයක් ලබා ගනු ඇතැයි නැවත නැවතත් පුරාසාරම් දොඩා තිබූ පාලක සභාගය සියයට 68 ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින්, සාමාජිකයන් 55 කින් යුක්ත සභාවේ ආසන 38 ක් දිනාගත්තේය. මීට මාස දෙකකට පෙර පැවති ඌව පලාත් සභා මැතිවරනයෙන් එජනිසට සියයට 72 ක ඡන්ද ප්‍රමානයක් ලැබුනි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ, පාර්ලිමේන්තු මැතිවරනයකට හා සමහර විට ජනාධිපතිවරනයකට සූදානම් වෙමින්, මැයි මාසයේ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව ලබා ගත් මිලිටරි ජයග්‍රහනය ගසාකනු වස් පලාත් සභා මැතිවරන මාලාවක් ම පවත්වා ඇත. දිවයිනේ දිග් ගැසුනු සිවිල් යුද්ධයේ අවසානය තව දුරටත් ජීවන මට්ටම්වල පරිහානියට හා ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාරයන්ට තුඩු දී ඇති බව වැඩ කරන ජනතාව අවබෝධ කරගැනීමට පටන් ගෙන ඇති තතු යටතේ ආන්ඩුවට පවත්නා සහයෝගය පල්ලම් බසිමින් තිබේ.

මැතිවරනයෙන් ජය ගැනීමට එජනිසට හැකිව ඇත්තේ, බොහෝ සෙයින් එහි ප්‍රධාන ප්‍රතිවාදීන්ගෙන් -- දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) -- විරුද්ධත්වයක් එල්ල නොවූ හෙයිනි. එජාප සියයට 25 ක ඡන්ද ප්‍රතිශතයක් හා ආසන 14 ක් දිනාගති. එජනිස සන්ධානයේ කොටසක් ලෙස 2004 මැතිවරනයේ දී ආසන 14 ක් දිනාගත් ජවිපෙට ලබා ගත හැකි වූයේ සියයට 6 ක සහයෝගයක් හා ආසන 3 ක් පමනි.

ආන්ඩුවට සිය මැතිවරන ව්‍යාපාරයට තිබුනේ එක තුරුම්පුවක් පමනි. එනම්, එල්ටීටීඊයේ මිලිටරි පරාජයයි. ඔක්තෝබර් 7 දා පැවති අවසන් එජනිස රැලියේ දී රාජපක්ෂ මෙසේ ප්‍රකාශ කලේය: "මීට කලින් තිබුනු ඔක්කොම ඡන්දවල දී ලැබුනු වැඩි ඡන්ද ප්‍රමානය ඉක්මවා යන ආකාරයේ හොඳ ප්‍රතිඵලයක් තමයි ආන්ඩුව දකුනෙන් බලාපොරොත්තු වෙන්නෙ. තිස් වසරක ත්‍රස්තවාදයෙන් රට මුදාගත්ත වීරෝදාර රනවිරුවන් ජාත්‍යන්තර යුද අපරාධ අධිකරනය ඉදිරියට ගෙන යන්න උත්සාහ කරන අයට ඒක හොඳ උත්තරයක් වේවි."

මිලිටරිය "ත්‍රස්තවාදය පරදවා ලබාගත් ජයග්‍රහනයට" වලකැපීමේ "ජාත්‍යන්තර කුමන්ත්‍රනය" පරාජය කිරීමට තමන්ට අතිමහත් බහුතරයක් ලබා දෙන ලෙස මැතිවරන ව්‍යාපාරය පුරාම රාජපක්ෂ සහ ඔහුගේ ඇමතිවරු ඉල්ලා සිටියහ. ඊනියා කුමන්ත්‍රනය සැඳහුම් කලේ, එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශ මත ඉවබවක් නැතිව බෝම්බ ප්‍රහාර එල්ල කිරීම මගින් යුද්ධයේ අවසන් මාස ගනනාව තුල දී ශ්‍රී ලංකා මිලිටරිය දහස් ගනනක් දෙමල සිවිල් වැසියන් ඝාතනය කිරීම ගැන එක්සත් ජනපදය හා යුරෝපා බලවතුන් සිදු කරන සීමිත විවේචනවලටය.

එල්ටීටීඊයේ පරාජයට ඉක්බිතිව, රාජපක්ෂ ආන්ඩුව මිලිටරිය විසින් පාලනය කරනු ලබන රැඳවුම් මධ්‍යස්ථාන තුල 250,000කට අධික සිවිල් වැසියන් පිරිසක් සිරගත කර තිබේ. එම කඳවුරුවලට ප්‍රවිෂ්ට වීමේ වැඩි ඉඩකඩක් ලබා දෙන ලෙසත් එම වැසියන් ඉක්මනින් යලි පදිංචි කරන ලෙසත් කෙරෙන ජාත්‍යන්තර ඉල්ලීම් ආන්ඩුව නොතකා හැර තිබේ. වොෂිංටනය හා එහි යුරෝපා සගයන් විසින් ගෙන යන උද්ඝෝෂනයට දෙමල සිවිල් ජනයාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ මොන යම් හෝ අව්‍යාජ උත්සුකතාවක් සමග මොනම සම්බන්ධතාවක් හෝ නැත. එය යොදා ගනු ලබන්නේ කොලඹ ආන්ඩුව මත පීඩනය යෙදීමේ ද දේශපාලන ආනුභාවය සඳහා සිය ප්‍රතිවාදීන්ට, විශේෂයෙන්ම චීනයට, වලකැපීමේ ද පහසු කඩතුරාවක් ලෙසය.

ප්‍රධාන කොටම දකුනු පලාතේ සිංහල ග්‍රාමීය ජනගහනය අතරින් බලගතු ජයග්‍රහනයක් ලබාගත හැකැයි රාජපක්ෂ පැහැදිලිවම ගනන් බලා තිබුනි. ඔහුගේ පවුල දිවයිනේ දකුනු කෙලවරේ හම්බන්තොට දිස්ත්‍රික්කයේය. ඔහු යන්තම් ජයගත් 2005 ජනාධිපතිවරනයේ දී, රාජපක්ෂ, "දකුනෙන් බිහිවන ප්‍රථම ජනාධිපති" ජයග්‍රහනය කරවන ලෙස ඡන්දදායකයන්ගෙන් ඉල්ලා සිටිමින්, පටු ප්‍රාදේශීයවාදය මත ලැජ්ජා විරහිත ලෙස සිය මැතිවරන ව්‍යාපාරය ගෙන ගියේය.

මැතිවරන කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරුනු ආරම්භක තක්සේරුවලට අනුව මෙම දිස්ත්‍රික්ක තුනේ ඡන්දය දුන් මුලු සංඛ්‍යාව සියයට 65 හා 70 අතරය. එය ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 80කට වැඩි අගයක් වන සම්ප්‍රදායිකව පැවති මට්ටමෙන් බෙහෙවින් පහල අගයකි. මැතිවරන නිරීක්ෂක කන්ඩායම් පවසන්නේ ඡන්දය දුන් මුලු සංඛ්‍යාව ඊටත් වඩා පහල අගයක් වන සියයට 57ක් බවයි. ඉහල අගය තෝරාගත්තා වුවත්, එජනිසට ලැබී ඇත්තේ ලියාපදිංචි මුලු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 47ක් පමනි.

යුද්ධයේ අවසානය සාමයේ හා සෞභාග්‍යයේ නව කාල පරිච්ඡේදයක් විවෘත කරනු ඇති බවට රාජපක්ෂ කල කියාපෑම මගින් ඇති කෙරුනු මුලාවෙන් බොහෝ ඡන්දදායකයෝ අත්මිදී ඇත. ආංශිකව ගත් කල දරුනු බලපෑමක් ඇති කරන යුද නය බරේ ප්‍රතිඵලයක් වන ගැඹුරුවන ආර්ථික අර්බුදයකට මුහුන දී සිටින ආන්ඩුව "ජාතිය ගොඩනැගීමේ" "ආර්ථික යුද්ධයක්" දියත් කර ඇත. එය වැඩ කරන ජනතාව මත අලුත් බරබද්දල් පැටවීමට පමනක් තුඩු දෙනු ඇත. යුද්ධයේ දී ඝාතනයට හා අංගවිකල භාවයට ලක් වූ සොල්දාදුවන් බොහොමයක් දරිද්‍රතාව හේතු කොට ගෙන හමුදාවට බැඳුනු ගම්බද තරුනයන්ය.

මැතිවරනය පැවැත්වුනේ ආරක්ෂක හමුදා හා එජනිසට සම්බන්ධිත මැරයන් විසින් ඇති කෙරුනු ත්‍රස්තයේ හා බියගැන්වීමේ වාතාවරනයක් තුලය. විරුද්ධ පක්ෂවල කාර්යාල ගිනිතබා විනාශ කෙරුනු අතර විපාර්ශ්වික අපේක්ෂකයන්ට තර්ජනය කරන ලදි. මැතිවරන නිරීක්ෂක සංවිධානයක් වන කැෆේ ආයතනය වාර්තා කලේ මැතිවරන දිනය තුලම මැතිවරන නීති උල්ලංඝනය වීම් 155ක් සිදු වූ බවයි. මැතිවරන ව්‍යාපාරය තුල දී අමතර පොලිස් භටයන් 7,000ක් සේවයේ යොදවනු ලැබුවත්, ආන්ඩුවේ මැතිවරන ව්‍යාපාරයේ යෙදුනු අය විවෘතව සිදු කල මැතිවරන නීති උල්ලංඝනයන් ඔවුන් නොතකා සිටි අතර සමහර අවස්ථාවන්හි දී විපාර්ශ්වයේ පැමිනිලි භාරගැනීම පවා ප්‍රතික්ෂේප කෙරුනි.

සාමාන්‍ය ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතිවාසිකම්වල ආරක්ෂකයකු නොවන, දක්ෂිනාංශික අයිලන්ඩ් පත්‍රයේ කතුවැකියක් ඊයේ මෙසේ අදහස් දැක්වීය: "මැතිවරන ව්‍යාපාරය නිල වසයෙන් අවසන් වන තෙක්ම සමහර කොටස් ඉවබවක් නැති පිලිකුලකින් යුක්තව නීති උල්ලංඝනය කරන ලද අතර. සමහර විරුද්ධ පක්ෂ රාජ්‍යයට-බැඳුනු පක්ෂ සමග නොපෑහෙන අරගලයක සිරවී සිටි අයුරු පැහැදිලිවම දැකගත හැකි විය. පහරදීම් පිලිබඳව, එජනිසයට සම්බන්ධිත නීතිය නොතකන දාමරික කොටස්වලට එරෙහිව විපාර්ශ්වික අපේක්ෂකයන් විසින් කරන ලද පැමිනිලි විභාග කොට වැරදිකරුවන් යුක්තිය හමුවට ගෙනවිත් ඇති ද යන වග දැනගැනීමට අපි බලා සිටිමු."

විපාර්ශ්වික පක්ෂ සම්බන්ධයෙන් මැතිවරන ප්‍රතිඵල විනාශකාරී වී ඇත. එජාප හා ජවිපෙ යන දෙගොල්ලම රාජපක්ෂගේ යලි ඇරඹූ යුද්ධයට සහයෝගය දුන් අතර එල්ටීටීඊයේ පරාජයෙන් පසුව ජයග්‍රහනය තුල තමන්ගේ කාර්යභාරයට හිමිකම් පෑමට ද උත්සාහ කලහ. කම්කරු පන්තිය හා පීඩිත ගම්බද ජනතාව මුහුන දෙන දරුනු වන ආර්ථික හා සමාජ අර්බුදයට මෙම එකදු පක්ෂයකට වත් පිලිතුරක් නැත. "නාස්තිය හා දූෂනය" සම්බන්ධයෙන් ආන්ඩුව ගැන ඔවුන් කරන විවේචන ඉලක්ක කර ඇත්තේ, ශ්‍රී ලංකාවේ හා ගෝලීය ධනවාදය මුහුන දෙන ප්‍රගාඪ අර්බුදය වහංගු කිරීමටයි.

ජවිපෙ සහයෝගී පදනම් බිඳවැටීම විශේෂයෙන් ම අර්ථභාරීය. මෙම පක්ෂය මාඕවාදය, කැස්ත්‍රෝවාදය හා සිංහල ජනතාවාදය මත පදනම්ව දරිද්‍ර ග්‍රාමීය තරුනයන් අතර ගරිල්ලා සංවිධානයක් ලෙස 1960 ගනන්වල පැනනැගුනි. 1983 දී යුද්ධය පැනනැගීමත් සමග එය වේගයෙන් දකුනට ගියේ, ඉන්දියානු සාම-සාධක හමුදාවක් බලෙන් පැටවීම මගින් යුද්ධය අවසන් කිරීමට උත්සාහ කල ඉන්දු-ලංකා ගිවිසුම ජාතිය පාවාදීමක් ලෙස හෙලාදකිමිනි.

1994 දී ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට එක්වූ ජවිපෙ, ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙක වන එජාප හා එජනිසයේ ප්‍රධාන සංරචකය වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) වෙතින් මහජනයා විරසක වීම ද වැඩෙන මහජන අතෘප්තිය ද පාලනය කිරීමේ ආරක්ෂක කපාටයක් ලෙස ප්‍රයෝජනවත් විය. 2004 දී එය ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග යටතේ සභාග ආන්ඩුවකට ඇතුලු වී ඇමති තනතුරු හතරක් ද -- කෘෂිකර්ම, ධීවර, සංස්කෘතික සහ සුලු කර්මාන්ත -- දැරී ය. ඊලඟ වර්ෂයේ දී ජවිපෙ රාජපක්ෂගේ මැතිවරන ව්‍යාපාරයට සහයෝගය දුන් නමුත් විපාර්ශ්වයේ රැඳී සිටියේය.

සෙනසුරාදා මැතිවරනයෙන් ජවිපෙ ලද ප්‍රතිඵල මගින් තහවුරු කෙරෙන්නේ, පක්ෂය ප්‍රධාන පක්ෂවලට විකල්පයක් ලෙස තව දුරටත් දකින්නේ නැති බවයි.

2004 දී එය ප්‍රථම වතාවට බලයේ සිටි කාලයේ, එනම් ඔවුන්ගේ ඇමතිවරු සිය මැතිවරන පොරොන්දු බිඳ දමා කුමාරතුංගගේ මහ ව්‍යාපාරික පිලිවෙත්වලට සහයෝගය දුන් කාලයේ, එම පක්ෂයේ වාර්තාව ඡන්දදායකයන්ට මතකය. ආන්ඩුවේ මිලිටරිවාදය පිලිබඳ මුලාවෙන් අත්මිදිනු අය, රාජපක්ෂගේ යුද්ධයට ගිරිය පුප්පාගෙන සහයෝගය දුන් හා ඔහුගේ යුද අයවැයවලට ඡන්දය දුන් ජවිපෙ වෙත හැරුනේ නැත.

රාජපක්ෂ මෙන්ම ජවිපෙ ද දකුනු ප්‍රාදේශීයවාදය සිය වාසියට යොදාගැනීමට උත්සාහ කලේය. එහි හිටපු නායක රෝහන විජේවීර දකුනෙන් පැමිනි අයෙකි. ඔහුගේ උමතු ස්වෝත්තමවාදයට ගැලපෙන පරිදි, ඔහු රෝහන යන නම ලබාගත්තේය. එය වනාහි සිංහල රජවරු යටතේ එම කලාපය සඳහා යොදා ගැනුනු පැරනි නාමයයි. 1971 දී ජවිපෙ ඛේදවාචකයක් බවට පත්වූ ගරිල්ලා නැගිටීමක් දියත් කල අතර එය දකුනේ සිංහල ග්‍රාමීය තරුනයන් අතරින් සැලකිය යුතු සහයෝගයක් දිනාගත්තේය. සෙනසුරාදා මැතිවරනයේ ප්‍රතිඵල මගින් පෙන්නුම් කෙරුනේ, එයට දකුනේ කලින් පැවති සහයෝගය බොහෝ සෙයින් වියැකී ගොස් ඇති බවයි.

ගාල්ල දිස්ත්‍රික්කය සඳහා අපේක්ෂක ලැයිස්තුවක් ඉදිරිපත් කල සමාජවාදී සමානතා පක්ෂය (සසප), ඡන්ද 95ක් ලබා ගත්තේය. යුදවාදය හා ස්වෝත්තමවාදය විසින් ආධිපත්‍යය දරන ලද දේශපාලන වාතාවරනයක් තුල ලැබුනු මෙම සෑම ඡන්දයක්ම සමාජවාදී හා ජාත්‍යන්තරවාදී විකල්පයක් වෙනුවෙන් ලැබුනු දැනුවත් ඡන්දයක් විය. සසප දෙමල, සිංහල හා මුස්ලිම් කම්කරුවන්ගේ එකමුතුව සඳහා උද්ඝෝෂනය කල අතර මිලිටරිය විසින් පවත්වා ගෙන යනු ලබන රඳවුම් මධ්‍යස්ථානවලින් දෙමල රැඳවියන් වහාම නිදහස් කරන ලෙසට කැඳවුම් කලේය.

මැතිවරන උද්ඝෝෂනය තුල දී, සසප කම්කරුවන් පමනක් නොව, කලින් ජවිපෙට හෝ ශ්‍රීලනිපයට සහයෝගය දී ඇති ගැමියන්, ධීවරයන් හා කුරුඳු තලන්නන් අතරින් ද සැලකිය යුතු ශ්‍රාවකත්වයක් දිනාගති. මධ්‍යම කඳුකරයේ ආගරපතන ප්‍රදේශයේ බැල්මෝරල් තේ වතුයායේ කම්කරුවන්ගේ ආදර්ශය අනුව යමින්, ශිෂ්‍ය සම්පන්න වැටුපක් හා සෙසු කොන්දේසි සඳහා සටන් වදිනු වස්, වෘත්තීය සමිතිවලින් ස්වාධීන, ක්‍රියාකාරී කමිටු ගොඩනගන ලෙස ඔවුන් දිරිගන්වනු පිනිස වතු කම්කරුවන් හමුවීමට ද සසප උද්ඝෝෂන කන්ඩායම් කටයුතු කලහ.

පක්ෂයට ඡන්දය දුන් හා අපගේ මැතිවරන උද්ඝෝෂනයට සහාය දුන් සියල්ලන්ට ම ස්තුති කිරීමට සසප කැමැතිය. පක්ෂයේ ඉදිරිදර්ශනය හා වැඩපිලිවෙල සැලකිල්ලෙන් අධ්‍යයනය කොට සසපට බැඳී කම්කරු පන්තියේ විප්ලවවාදී පක්ෂය ගොඩනගන ලෙස අපි ඔවුන්ගෙන් උදක්ම ඉල්ලා සිටිමු.

© www.wsws.org